**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**
கிறிஸ்தவ மத அலுவல்கள் திணைக்களம்
**Department of Christian Religious Affairs**

බයිබල් දැනුම මිනුම ලිඛිත විභාගය 2025 | 10,11
திருவிவிலிய அறிவுப் போட்டி 2025 | 10,11
Bible Quiz Written Examination 2025 | 10,11

පැය : 2
நேரம் : 2
Hour : 2

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**/ எல்லா வினாக்களுக்குமான விடைகளை இந்த வினாத்தாளிலேயே விடையளிக்கவும் / Answer all the questions in the space provided

විභාග අංකය
பரீட்சை எண்
Index No

.............................................
ශාලා නිරීක්ෂකගේ අත්සන /
மண்டப மேற்பார்வையாளரின் கையொப்பம்.
/ Signature of the Invigilator

උපදෙස් / அறிவுறுத்தல்கள்/ Instructions

- මෙම පිටුවෙත් සියලුම පිටුවලත් ඔබගේ විභාග අංකය නිවැරදිව ලියන්න / இந்த பக்கத்திலும் சகல பக்கங்களிலும் உங்கள் பரீட்சை எண்ணை சரியாக எழுதவும். / Write your Index number correctly on this page and on all other pages
- 01 සිට 10 වඩාත් සුදුසු පිළිතුර යටින් ඉරක් අදින්න. / 01 முதல் 10 வரை பொருத்தமான விடையின் கீழ் கோடிட்டுக் காட்டுக. / Underline the most appropriate answer to question 01 to 10
- 11 සිට 45 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න. / 11 முதல் 45 வரையான வினாக்களுக்கு சரியான விடை அளிக்கவும் / Give correct answers to question 11 to 45
- 46 සිට 50 දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න. / 46 முதல் 50 வரை பொருத்தமான வார்த்தையை வைத்து இடைவெளியை நிரப்புக. / Fill in the blanks from 46 to 50 using the appropriate words

**For Examiner's use only**

| Page | Marks |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| **TOTAL** | |

Examined by:

Checked by :

Index Number ………………………………………….  Marks

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. හන්නා හා පෙනින්නා යන දෙදෙනාගේ ස්වාමිපුරුෂයා වූයේ කව්රුන්ද?

a. ඒලී  b. එල්කානා  c. හොෆ්නි  d. පිනෙහස්

02. සාමුවෙල්ගේ පුත්‍රයෝ යුක්තියට පිටුපා සිදුකළ ක්‍රියාව කුමක්ද?

a. රන්වස්සෙකු සාදා වන්දනා කිරීම
b. බාල් දෙවියන්ට පූජා ඔප්පු කිරීම
c. ගිවිසුම් කරඬුව පැහැර ගැනීම
d. වස්තු තණ්හාවෙන් අල්ලස් ගැනීම

03. සාමුවෙල් විසින් සාවුල්ව අභිෂේක කරන ලද්දේ කෙසේ ද?

a. තෙල් කුලාව රැගෙන හිසේ වත් කිරීම මඟින්
b. හිස මත අත් තැබීම මඟින්
c. වර්ණවත් ඇඳුමක් පැළඳවීම මඟින්
d. සිය සිංහාසනය ප්‍රදානය කිරීම මඟින්

04. බෙන්ජමින් දේශ සීමවේදී සාවුල්ට මිනිසුන් දෙදෙනෙකු හමුවන්නේ කාගේ සොහොන් පළ ළඟදී ද?

a. බෙන්ජමින්ගේ
b. ආබ්‍රහම්ගේ
c. රාකෙල්ගේ
d. අබියෙල් ගේ

05. සාමුවෙල් විසින් සාවුල්ව රජකමෙහි නැවත වරක් ස්ථිර කරනු ලැබුවේ කුමන නගරයේ දීද?

a. ගිලියද්
b. මිෂ්පා
c. ජාබෙෂ්
d. ගිල්ගාල්

06. සාවුල් රජතුමා ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි කොපමණ අවුරුදු ගණනක් රජකම් කළේද?

a. සිව් අවුරුද්දක්
b. දස අවුරුද්දක්
c. දෑ අවුරුද්දක්
d. සය අවුරුද්දක්

Index Number ……………………………………….  Marks

07. මුළු ශරීරය ප්‍රේමයෙන් වැඩි වර්ධනය වීමට නම් එක එක අවයවයට හිමි කාර්යය කුමක් ද?

a. ඊට යුතු ලෙස ක්‍රියා කිරීම
b. මන්දගාමීව කටයුතු කිරීම
c. විවේකයෙන් තොරව ක්‍රියා කිරීම
d. ශක්තිමත් බවින් ක්‍රියා කිරීම

08. පුහු අදහස් ඇති අය හැඳින්වූයේ කුමන නමකින් ද?

a. මිසදිටුවන්
b. අදමිටුවන්
c. දමිටුවන්
d. අනුවණයන්

09. සමගිකමේ බැම්මෙන් පවත්වාගන්නට උත්සහ කළ යුත්තේ කුමක්ද?

a. එක්සත්කම
b. යහළුකම
c. කරුණාව
d. ප්‍රේමය

10. දෙවියන් වහන්සේගේ වරප්‍රසාද සම්පතේ ප්‍රකාරයට අපට මිදීමත්, පව් කමාවත් ලැබී ඇත්තේ කුමක් කරණකොට ගෙනද?

a. ක්‍රිස්තුස් වහන්සේගේ යාගික රුධිරය කරණකොට ගෙන
b. ශුද්ධාත්ම වරම් කරණකොට ගෙන
c. කිතු දහම පිළිබඳ අනාවරණය කරණකොට ගෙන
d. දේව වචනයේ මඟ පෙන්වීම කරණකොට ගෙන

**පිළිතුරු සපයන්න**

11. මිශ්පා නගරයට රැස්වූ ඉශ්‍රායෙල්වරුන් සිදුකළ පූජාවේ අඩංගු කරුණු දෙකක් ලියන්න.

……………………………………………………………………………………………………

12. බෙයර්-ෂෙබා හී විනිශ්චයකරුවන් වූ සාමුවෙල්ගේ පුතුන් දෙදෙනාගේ නම් මොනවා ද?

……………………………………………………………………………………………………

13. ''මෙන්න මා නුඹට කී මිනිසා. මොහු මාගේ සෙනඟ පාලනය කරන්නේය.'' මෙය කා විසින් කා හට පවසන ලද්දක් ද?

……………………………………………………………………………………………………

14. අභිෂේක කිරීමට පෙර මොහොතක් නවතින ලෙස සාමුවෙල් සාවුල්ගෙන් ඉල්ලා සිටියේ මන්ද?

……………………………………………………………………………………………………

15. දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ආරූඪ වීමෙන් පසු සාවුල් කළේ කුමක් ද?

……………………………………………………………………………………………………………

16. භාණ්ඩ අතරේ සැඟවී සිට සොයා ගත් සාවුල්ව, සාමුවෙල් විසින් සෙනඟට හඳුන්වා දුන්නේ කෙසේ ද?

……………………………………………………………………………………………………………

17. අම්මොනිය නාහාෂ්, ජාබෙෂ් හි මනුෂ්‍යයෝ සමඟ ගිවිසුම් ගත වීම සඳහා එකඟ විය යුතු යැයි පැවසුවේ කුමකට ද?

……………………………………………………………………………………………………………

18. රජෙකු ඉල්ලීමෙන් සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි කළ දුෂ්ඨකම ඉශ්‍රායෙල්වරුන් තේරුම් ගත්තේ කුමක් සිදු වීමෙන් පසුවද?

……………………………………………………………………………………………………………

19. ගෙබායෙහි සිටි පිලිස්තිවරුන්ගේ මුර හමුදාවට පහර දුන් පුද්ගලයා කවුරුන් ද?

……………………………………………………………………………………………………………

20. ඉශ්‍රායෙල්වරු තමන්ගේ උදලු, දැකැති, හීවැල්, මුවහත් කිරීමට හා කෙවිටි සාදා ගැනීමට ගෙවිය යුතු මුදල කොපමණ ද?

……………………………………………………………………………………………………………

21. එල්කානා අවුරුදු පතා තම නගරයෙන් නික්මගොස් ෂිලෝහිදී කළේ කුමක්ද?

……………………………………………………………………………………………………………

22. සමිඳාණන් වහන්සේට සේවය කළ පූජකයන් වූ ඒලීගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

……………………………………………………………………………………………………………

23. 1 සාමුවෙල් 2:26 වගන්තියට අනුව සාමුවෙල් තම ළමාවියේ දී හැදී වැඩුනු ආකාරය ලියා දක්වන්න.

……………………………………………………………………………………………………………

24. ''කථා කළ මැනව. ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටිනවා.'' මෙය කා විසින් කා හට පවසන ලද්දක් ද?

……………………………………………………………………………………………………………

25. ගිවිසුම් කරඬුව කඳවුරට ගෙනෙනු ලැබූ කළ මුළු ඉශ්‍රායෙල් ජනතාව සිදු කළේ කුමක්ද?

……………………………………………………………………………………………………………

26. ගිවිසුම් කරඬුව දාගොන් දෙවියාගේ දේවාලයට ගෙන ගොස් තැබූ පසු සිදු වූ දේවල් දෙකක් ලියන්න.

……………………………………………………………………………………………………

27. එක්‍රොන් නගරයේ වැසියන් ගිවිසුම් කරඬුව ප්‍රතික්ෂේප කළ විට එම නගරයට සිදු වූ පීඩාවන් මොනවා ද?

……………………………………………………………………………………………………

28. පිලිස්තිවරුන්ගේ රටින් ගිවිසුම් කරඬුව රැගෙන යාමට සූදානම් කළ ගැලට බඳින ලෙස නියෝග කළේ කුමන සත්වයන් ද?

……………………………………………………………………………………………………

29. සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව තැබූ විශාල ගල පිහිටා තිබුනේ කොහේ ද?

……………………………………………………………………………………………………

30. අබිනාදබ්ගේ ගෙට ගෙන ගොස් තැබූ සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව රක්ෂා කරන පිණිස භාරකරු ලෙස පත් කළේ කවරෙක් ද?

……………………………………………………………………………………………………

31. එපීස ලිපිය ආරම්භයේ දී පාවුලුතුමා එපීසයේ සිටින ජේසුස් ක්‍රිස්තුස් වහන්සේව අදහන්නන් ආමන්ත්‍රණය කරන්නේ කෙලෙස ද?

……………………………………………………………………………………………………

32. පාවුලුතුමා ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය ලෙස හඳුන්වන්නේ කුමක් ද?

……………………………………………………………………………………………………

33. පුණ්‍ය ක්‍රියා වල ප්‍රතිඵලයක් නොවන්නේ මින් කුමක් ද?

……………………………………………………………………………………………………

34. ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ අභිරහස ශුද්ධ ප්‍රේරිතයනට හා දිවැසිවරුන්ටත් එළිදරව් කර ඇත්තේ කුමක් කරණ කොට ගෙනද?

……………………………………………………………………………………………………

35. දෙවියන් වහන්සේගේ කරුණාවේ දීමනාව ලෙස පාවුලු තුමාව පත් කරනු ලැබුවේ කවුරුන් ලෙස ද?

……………………………………………………………………………………………………

36. මුළු ශරීරය ඊට සපයා ඇති එක එක අවයවයන් ගෙන් සන්ධි කොට ඒකාබද්ධ කරනු ලබන්නේ කුමකින් ද?

……………………………………………………………………………………………………

37. දෙවියන් වහන්සේගේ ස්වරූපය අනුව මවන ලද මිනිසා ලබන අලුත් ස්වභාවයේ ලක්ෂණ මොනවා ද?

…......................................................................................................................................

38. ''………………...................……...................………... ඔබ රවටන්නට කිසිවෙකුට ඉඩ නොදෙන්න.'' (හිස්තැනට යෝග්‍ය වචන යොදන්න)

39. සමිදාණන් වහන්සේ පවසන පරිදි දරුවන් කෝප නොකර ඇති දැඩි කළ යුත්තේ කෙසේද?

…......................................................................................................................................

40. තම දාසයන් සම්බන්ධව ස්වාමිදරුවන් වැළකිය යුත්තේ කුමන දුර්ගුණයෙන් ද?

…......................................................................................................................................

41. ක්‍රිස්තුන් වහන්සේ අපට ප්‍රේම කොට ………………............................................................ ද

…………………….......……........... ද හැටියට අප වෙනුවෙන් දෙවියන් වහන්සේට සිය ජීවිතය පරිත්‍යාග කළාක් මෙන් ඔබත් ප්‍රේමයෙන් ජීවත්වන්න (මෙහි හිස්තැන් පුරවන්න)

42. පාවුලු තුමා එපිස වරුන්ට ලියන ලද ලිපියේ 5:5 වගන්තිය අනුව ක්‍රිස්තුස් වහන්සේගේ ද, දෙවියන් වහන්සේගේ ද රාජ්‍යයෙහි උරුමයක් නොලැබෙන අය ලෙස සළකනු ලබන අයවලුන් වර්ග දෙකක් සඳහන් කරන්න?

…......................................................................................................................................

43. ශු. පාවුලුතුමාට අනුව, පුරුෂයන් තම භාර්‍යාවන්ට ප්‍රේම කළ යුත්තේ කෙසේ ද?

…......................................................................................................................................

44. පාවුලුතුමා එපීසවරුන් අතරට තුකිකස් එවන්නේ කුමන කරුණු සඳහා ද?

…......................................................................................................................................

45. යක්ෂයාගේ සියලු උපාය වලට විරුද්ධව සිටීමට දෙවියන් වහන්සේගේ සන්නාහයෙන් සන්නද්ධ විය යුතු ආකාරය එපීස ලිපියෙහි දක්වා ඇති ආකාරය පහත දක්වා ඇත. ඒවායින් දැක්වෙන අර්ථයන් ලියා දක්වන්න.

උදා : හිස් වැස්ම - ගැළවීම
පාවහන් - සාම සුභ අස්න



a. ළයවැස්ම :……………………

b. ඉඟපටිය :…………..……...……

c. කඩුව :……………………

d. පළිහ :……………….……...…

Index Number ………………………………………….                Marks

**කටපාඩම් පද**

46. ගීතාවලිය 23 පරිච්ඡේදයේ 4 වගන්තිය.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

47. ගීතාවලිය 108 පරිච්ඡේදයේ 13 වගන්තිය.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

48. හිතෝපදේශය 24 පරිච්ඡේදයේ 28 වගන්තිය.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

49. හිතෝපදේශය 3 පරිච්ඡේදයේ 33 වගන්තිය.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

50. උපදේශකයා හෙවත් සිරාක් 6 පරිච්ඡේදයේ 14 වගන්තිය.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

Index Number …………………………………………. Marks